www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ නිදහස් දින උත්සවයේ දී වර්ගෝත්තමවාදය හා මිලිටරිවාදය ප්‍රදර්ශනය කෙරේ

## Communalism and militarism on display at Sri Lanka’s independence day celebrations

**කේ. රත්නායක විසිනි**
**2008 පෙබරවාරි 9**

ශ්‍රී ලංකාවේ නිදහස සමරනු පිනිස පසුගිය සඳුදා පැවති නිල උත්සවය, කිසිදු මහජන සහයෝගයකින් තොර වූ ද ආරම්භයේ සිට අවසානය දක්වා ම දේශභිතෛෂී කයිවාරුවල හා මිලිටරිවාදයේ ආධිපත්‍යයට යටත් වූ ද ඇල්මැරුනු සිද්ධියක් විය. බ්‍රිතාන්‍ය විජිත පාලනයෙන් හැට වසරකටත් පසුව, වර්ගෝත්තමවාදය, සමාජ කාලකන්නිභාවය හා අවසානයක් දක්නට නොහැකි 25-වසරක සිවිල් යුද්ධය හැර වැඩ කරන ජනතාවට අන් කිසිවක් දීමට ආන්ඩුවත් සමස්තයක් ලෙස දේශපාලන සංස්ථාපිතයත් සමත්ව නැත.

එදින උත්සවයේ මූලාසනය දැරූ ජනාධිපති මහින්ද රාජපක්ෂ 2002 සටන් විරාමය බිඳ දැමීම හා දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද්ධය යලි ඇරඹීම සම්බන්ධයෙන් සෘජුව ම වගකිව යුතු ය. උත්සවය පැවතියේ දිවයිනේ උතුරේ යුද ගැටුම් ද අගනුවර බෝම්බ පිපිරීම් ද සිදු වන කොන්දේසි යටතේ ය. දහස් සංඛ්‍යාත පොලිස් හා හමුදා භටයෝ කොලඹ හා උප-නගර ප්‍රදේශ පුරා සෝදිසි කපොලු හා මාර්ග බාධකවල යොදවනු ලැබ තිබුනි. “කොටි ත්‍රස්තවාදීන්” පිලිබඳව සෝදිසි කිරීමේ කඩතුරාව යටතේ ආරක්ෂක හමුදාවෝ දෙමල ජනයා සිය ගනනක් අත්අඩංගුවට ගත්හ.

කොලඹ නගර මධ්‍යය මුලුමනින් ම පාහේ ජනයාගෙන් හිස්ව පැවතුනි. හමුදා මූලස්ථානය ඉදිරිපිට ගාලු මුවදොර පිටියේ පැවති “ජාතික උත්සවයට” සහභාගි වීමට අවසර ලැබුනේ ආරාධිතයන්ට -- විදේශ තානාපති නිලධාරින්ට, ඇමතිවරුන්ට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා ඉහල මිලිටරි නිලධාරින්ට” පමනි. උත්සව සභාව මුලුමනින් ම පාහේ සමන්විත වූයේ මිලිටරි භටයන්ගෙන් හා පාසල් ශිෂ්‍යශිෂ්‍යාවන්ගෙනි. ඔවුන් සියල්ලන් ම ද ක්‍රියා කලේ ආඥාවන් යටතේ ය. සන්නද්ධ සේවා ප්‍රධානීන් හා පොලිස්පති විසින් රාජපක්ෂ කථිකාසනය වෙත කැටුව යන ලදි. පාසල් ශිෂ්‍යාවන් කන්ඩායමක් ජාතික ගීය ගායනා කලා ය.

මිලිටරිය සිය බලය ප්‍රදර්ශනය කලේ ය. දහස් සංඛ්‍යාත හමුදා හා පොලිස් භටයෝ සිය යුද ටැංකි, මල්ටි-බැරල් රොකට් විදිනයන් හා බර කාලතුවක්කු සහිතව නිල වේදිකාව පසු කරමින් ආචාර පෙලපාලි දැක්වූහ. ගුවන් හමුදාවේ ප්‍රහාරක හෙලිකොප්ටර් යානා සහ ප්‍රහාරක ජෙට් යානා ඉහල අහසේ පියාසර කල අතර නාවික හමුදා යාත්‍රා ගාලු මුවදොර පිටිය යාබද මුහුදේ යාත්‍රා කලේ ය. උත්සවය ආන්ඩුවේ හුදකලාව, මිලිටරිය මත එහි රදාපැවැත්ම සහ දේශපාලන සංස්ථාපිතයත් යුද්ධය අවශ්‍ය නැති මහජනතාවත් අතර පවත්නා පුලුල් පරතරය පිලිබඳ පැහැදිලි ප්‍රදර්ශනයක් විය.

පාලක ප්‍රභූවේ දේශපාලන බංකොලොත්කම රාජපක්ෂගේ කතාවෙන් කැටි කර දැක්වුනි. 1948 නිදහසේ පටන් මේ දක්වා අත්පත් කර ගෙන ඇති කිසිදු දැවැන්ත ජයග්‍රහනයක් පෙන්වා දීමට හෝ 1983 යුද්ධය පිපිරීමට තුඩු දුන් කාරනාවලට ආමන්ත්‍රනය කිරිමට හෝ ජනාධිපති සමත් වූයේ නැත. ඒ වෙනුවට, ඔහුගේ ආන්ඩුව “නිදහස අර්ථවත් කරන්න . . . මතු කර ගත් ඉතා වැදගත් තීරනාත්මක දෙයක් තියෙන” බවත් “එය වෙනත් දෙයක් නොවෙයි . . . රට ගැන හැඟීම, නැතිනම් ආදරයි” බවටත් ඔහු පුරසාරම් දෙඩුවේ ය.

කොලඹ දේශපාලනඥයන්” රට ගැන හැඟීමට, නැතිනම් ආදරයට” ආයාචනා කිරීම තුල, කෙසේ වෙතත්, කිසිදු අලුත් දෙයක් ඇත්තේ නැත. එය අනන්‍ය වන්නේ, වැඩ කරන ජනතාව භේද කරනු පිනිස 1948 පටන් නැවත නැවතත් යොදා ගනු ලැබ ඇති සිංහල බෞද්ධ අධිපතිවාදය හා දෙමල විරෝධී වෙනස්කම් කිරීමේ පිලිවෙත සමග ය. රාජපක්ෂ කරන්නේ පලමු කොට ම යුද්ධය පැන නැඟීමට තුඩු දුන් ප්‍රතිගාමී වර්ගෝත්තමවාදය වැඩි දියුනු කරන බවට පොරොන්දු වීම පමනි.

“නිදහස අර්ථවත්” කරනු පිනිස නම්, රාජපක්ෂ ආන්ඩුව දරුනු හදිසි නීති රෙගුලාසි යටතේ පාලනය ගෙන යමින්. මාධ්‍ය මත තථ්‍ය වාරනයක් පනවා. විශේෂයෙන් ම කම්කරුවන් හෝ ගම්බද දූගීන් වෙතින් සිය පිලිවෙත් සම්බන්ධයෙන් එල්ලවන ඕනෑම විපරිමතයක් හෝ විරුද්ධත්වයක් රාජ්‍ය ද්‍රොහිත්වයක් ලෙස නැවත නැවතත් හංවඩු ගසා ඇත. විරුද්ධ පක්ෂ වෙත නොසැඟවුනු තර්ජනයක් එල්ල කරමින් ඔහු ප්‍රකාශ

කර සිටියේ, අභියෝගය වන්නේ "මේ රටේ ජනතාව දැන් රට කෙරෙහි තබා තිබෙන ආදරය දේශපාලන පක්ෂ භේදයට දේශපාලන උවමනාවන්ට යටවීමට නොදී, රටට අවංක වෙමින්, එය පවත්වා ගැනීම" බව යි.

ප්‍රධාන විරුද්ධ පක්ෂ -- එක්සත් ජාතික පක්ෂය (එජාප) සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) -- නිල උත්සවය වර්ජනය කලහ. මෙම පක්ෂ දෙක ම යුද්ධයට සහයෝගය දෙන අතර සිංහල අන්තවාදී ජවිපෙ වඩා ආක්‍රමනශීලී මිලිටරි ක්‍රියාමාර්ග අවශ්‍ය බවට අවධාරනය කරයි. එහෙත් ගැඹුරින් ම ජනතා අප්‍රසාදයට ලක්ව ඇති ආන්ඩුවක් හා එහි පිලිවෙත් සමග අනන්‍ය වීමට ඔවුන්ට අවශ්‍ය නොවුනි. එල්ටීටීඊ-හිතැති දෙමල ජාතික සන්ධානය ද උත්සවය වර්ජනය කලේ ය.

එජාපය 1948 දී නිදහස දිනා ගත් නමුත් "එජාප ආන්ඩු හැර අන් සියලු ආන්ඩු නිදහස සමග දිනාගත් අපගේ ජයග්‍රහන ආපසු හරවා ඇති" බව කියමින් එජාප මහ ලේකම් තිස්ස අත්තනායක වැලපුනේ ය. තථ්‍ය කාරනාව නම්, නැගී සිටි කම්කරු පන්තියකට මුහුන දී සිටි, 1948 දී එජාපය තුලට ගාල් වී ගත් ධනේශ්වර දේශපාලනඥන්ට නිදහස අවශ්‍ය නොවූ බව යි, එය ඔවුන් මත පැටවුනු දෙයක් බව යි. ආරම්භයේ පටන් ම, එජාපය කම්කරුවන් භේද කරනු පිනිස සිංහල ස්වෝත්තමවාදය මත පාදක විය. 1983 දී යුද්ධය දියත් කොට පලමු 11 වසර තුල එය ක්ෂමාවිරහිත ලෙස පවත්වා ගෙන යාම එජාපයේ "ජයග්‍රහන" අතරට වැටෙයි.

ජීවන මට්ටම් කඩා වැටීම සම්බන්ධයෙන් පුලුල්ව පැතිර පවත්නා අසහනකාරී තත්වය ගැන රාජපක්ෂ හොඳින් දනී. සිය කතාවේ දී ඔහු මෙසේ ප්‍රකාශ කලේ ය "ලෝක ආහාර හිඟයයි තෙල් මිල ගනන් ඉහල යාමයි නිසා ඇති වී තිබෙන අධික ජීවන බරෙන් ලෝක ජනතාව වාගේම අපේ ජනතාවත් පෙලෙන බව අපි දන්නවා." මිලිටරි වියදම් දැවැන්ත ලෙස ඉහල දැමීමේ උද්ධමනකාරී බලපෑම, ඉන්ධන හා සෙසු මූලික භාන්ඩවල සහනාධාර ආන්ඩුව විසින් කප්පාදු කරනු ලැබීම හෝ ඉහල පොලී අනුපාතිකවලට ජාත්‍යන්තර මූල්‍ය වෙලඳ පොලෙන් දැවැන්ත ලෙස නය ගැනීම පිලිබඳව කිසිදු සඳහනක් නොවී ය.

වැඩ කරන ජනතාවට දීමට ජනාධිපතිට තිබූ එක ම දෙය වූයේ "දුෂ්කරතා සදාකාලික ඒවා නොවන" බවත් "කෙටි කාලීන දුෂ්කරතා දිගු කාලීන යහපතකට මඟපාදන" බවත් පිලිබඳ හිස් පොරොන්දු පමනි. එල්ටීටීඊයට විරුද්ධව ලබා ගන්නා ඉක්මන් ජයග්‍රහනයක් දිවයිනේ ආර්ථික අනාගතය වැඩි දියුනු කරනු ඇතැයි රාජපක්ෂ බලාපොරොත්තු වන බවට සැකයක් නැත. කෙසේ වෙතත්, එල්ටීටීඊයට මිලිටරි පරාජයක් අත්පත් කර දීම 25 වසරක වාර්ගික යුද්ධය අවසන් කිරීමට සමත් නොවන්නා සේ ම විදේශ ප්‍රාග්ධනයේ හදිසි ගලා ඒමකට හා ආර්ථික උත්පාතයකට එය අවශ්‍යයෙන් ම තුඩු දෙන්නේ ද නැත. සිදු වීමට වඩාත් ම ඉඩ ඇති දෙය නම් යුද්ධය දිගට ඇදෙන තතු තුල, එලඹෙන එක්සත් ජනපද ආර්ථික පසුබැස්ම හා ජාත්‍යන්තර මූල්‍ය කලබගෑනිය ශ්‍රී ලංකාවේ අසාධ්‍ය ආර්ථික අර්බුදය ගැඹුරු කිරීම යි.

"නැගෙනහිර මුදා ගැනීම" මහා ජයග්‍රහනයක් ලෙස පෙන්වාලීමට රාජපක්ෂ මහත් පරිශ්‍රමයක් දැරී ය. 2006 ජුලි මස සිය ප්‍රථම ආක්‍රමනය දියත් කිරීමෙන් පසුව මිලිටරිය එල්ටීටීඊයේ නැගෙනහිර ප්‍රධාන බල මධ්‍යස්ථාන සියල්ල ම අල්ලා ගැනීමට සමත්ව ඇත. ජනාධිපති නැගෙනහිර පලාතේ ආර්ථක සංවර්ධනයේ හා "ප්‍රජාතන්ත්‍රවාදය" ගොඩනැගීමේ වේගය වගවර්නනා කලේ ය. තථ්‍ය කාරනාව නම්, ආන්ඩුවේ ආක්‍රමන අඩු ගනනේ 200,000ක් ජනයා උන්හිටිතැන්වලින් පලවා හැර ඇති අතර ඔවුන්ගේ ඉඩකඩම් නිදහස් වෙලඳ කලාප පිහිටුවනු පිනිස මිලිටරිය විසින් අල්ලා ගනු ලැබ ඇත. වත්මන් පලාත් පාලන මැතිවරනයේ දී, රාජපක්ෂගේ පාලක සන්ධානය, මැර බලය හා ප්‍රචන්ඩත්වය සම්බන්ධයෙන් කුප්‍රකට දෙමල පැරා-මිලිටරි කන්ඩායමක් වන තමිල් විඩුතලෙයි මක්කල් පුලිහල් (ටීවීඑම්පී) සමග සන්ධානයක් තනා ගෙන ඇත.

රාජපක්ෂගේ සාරදර්ශී කතාව තිබිය දී ම, එය නොතකා, මේ සතියේ කොලඹ පුවත්පත් ගනනාවක ම කතුවැකි මගින් පිලිබිඹු කෙරෙන්නේ දේශපාලන ප්‍රභූවේ පුලුල් ස්ථර අතර පවත්නා අපේක්ෂාභංගත්වයේ මනෝගතියකි. පසුගිය දශක හය මුලුල්ලේ ලබා ගත් කිසිදු ජයග්‍රහනයක් ආඩම්බරයෙන් පෙන්වා දීමට කිසිවෙක් සමත්ව නැත. සියල්ලෝ ම වාර්ගික දේශපාලනයේ ගිලී යුද්ධයට සහයෝගය දෙති. එහෙත් මිලිටරි ජයග්‍රහනයක් හෝ ආර්ථික වැඩි දියුනුවක් පිලිබඳ දැවැන්ත බලාපොරොත්තුවක් ද ඔවුන්ට නැති අතර පාලක කව තුල ඔඩු දුවා ඇති දූෂනය හා ප්‍රචන්ඩත්වය පිලිබඳව ඔවුහු අවඥා සහගතව කතා කරති.

නිදසුනක් ලෙස. සන්ඩේ ටයිම්ස් පහත දැක්වෙන අඳුරු චිත්‍රය ඉදිරිපත් කරයි: "අප දැන් මුහුන දී සිටින්නේ, ස්වෛරී රාජ්‍යයකට යහ පාලනය ගැන ආඥාවන් ලබා දෙන විදේශ ආධාරපතියන්ගේ අනුකම්පාව යටතේ සිටින, නූපන් පරම්පරාවන්ට අනාගතයේ දී ගෙවීමට සිදු වන නය වානිජ බැංකුවලින් නොකඩවා ලබා ගන්නා, මහජන මුදල් පිල්ලි ගසන හා නාස්ති කරන, සිය නිවෙස්වල ලිප ගිනි දැල්වීම අඛන්ඩව පවත්වා ගනු පිනිස රටේ පුරවැසියන්ගෙන් සෑම 20කට ම එක් අයෙකු බොහෝ විට දරුනු කොන්දේසි යටතේ එතෙර රැකියාවන්හි නිරත වන, විරැකියාවෙන් ගහන, මන්දපෝෂනයෙන් පෙලෙන, බඩු මිල පිම්මේ නගින, දූෂිත දේශපාලනඥයන්ගෙන් යුක්ත, පිරිහෙන මානව හිමිකම් වාර්තාවන් සහිත, ඉතිරිව පවත්නා යමක් වේ

නම් එය කා දමන හා ජීවිත, අත්පා. දේපොල හා ආර්ථිකය පැත්තෙන් භයංකර මිලක් ගන්නා සන්නද්ධ ගැටුමක් සහිත, තර්ජනයකට ලක්ව පවත්නා ජාතියකට ය."

එම පුවත්පතට සොයා ගත හැකි එක ම බලාපොරොත්තුවේ එලිය වූයේ මෑත මත විමසුමකි. එය පෙන්වා දී ඇත්තේ ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක්, තමන්ට අවස්ථාව දුන හොත් රට හැර නොයනු ඇති බව යි. සමහර අප්‍රිකානු රටවල පවත්නා ගෝත්‍රික යුද්ධවලට, දූෂනයට හා ඒඩ්ස් රෝගයට සැඳහුම් කරමින්, කතුවැකිය ප්‍රකාශ කරන්නේ, "අපගේ සියලු කරදර තිබිය දී ම, අපි අපගේ වාසනාමහිමයන් ගැන විශ්වාසය තැබිය යුතු" බව යි. එහෙත් "අප මෙම නිදහස සමරන්නේ . . . අගනගරය මුලුමනින්ම පාහේ වටලනු ලැබ ඇති පසුබිමක ය යන කටුක යථාර්ථය නොතකා අපට කටයුතු කල නොහැකි" යයි පුවත්පත තව දුරටත් කියා සිටී.

"ත්‍රස්තවාදී වසංගතයට පමනක් නොව ඉහල තැන්වල පවත්නා දූෂන වංසගතයට, අකාර්යක්මතාවයේ වසංගතයට සහ නාස්තිය ගැන පවත්නා පරිපූර්න නොතැකීමට" එරෙහිව සටන් කිරීමට ද ඒකාග්‍රිත ප්‍රයත්නයක් දැරිය යුතු යැයි කතුවැකිය ඉල්ලා සිටී. චර්චිල් උපුටා දක්වමින් ලේඛකයා තව දුරටත් කියා සිටින්නේ තවමත් ප්‍රමාද නැති බව යි: "අපි තවමත් අපගේ ඉරනමේ තීන්දුකරුවෝ වෙමු. අපි තවමත් අපගේ ආත්මයන්ගේ මෙහෙයුම්කරුවෝ වෙමු." එහෙත් පූච්චානම්වලින් මහත් ඉහලට නැග ගැනීමෙන් පසුව, කතුවැකිය ඉක්මනින් ම සමාප්ත වන්නේ වත්මන් ව්‍යසනකාරී තත්වය පිලිබඳව කිසිදු පැහැදිලි කිරීමක් හෝ විසඳුමක් ඉදිරිපත් කිරීමෙන් තොරව ය.

පාලක කව තුල පවත්නා මෙම ගැඹුරු අසාරදර්ශනය හා පක්ෂාඝාතවීම ම 60 වසරක ධනපති පන්ති පාලනය පිලිබඳ අපහාසාත්මක අධි චෝදනයක් මෙන් ම ඉදිරියේ පවත්නා ප්‍රගාඪ දේශපාලන කලබගෑනිය පිලිබඳ සලකුනක් ද වේ. සමාජවාදී සමානතා පක්ෂය පෙබරවාරි 4 දා සිය ප්‍රකාශය තුල පැහැදිලි කල පරිදි, වත්මන් අවුල ප්‍රගතිශීලී පදනමක් මත විසඳලීමට සමත් එක ම සමාජ බලවේගය වන්නේ සමාජවාදී හා ජාත්‍යන්තරවාදී ඉදිරිදර්ශනයකින් සන්නද්ධ කම්කරු පන්තිය යි.

© www.wsws.org